# බෞද්ධාගමික තේමා රැගත් සිංහල චිත්‍රපටවල දෙබස් ආශ්‍රිත භාෂණ ශබ්ද සම්බන්ධව වාග් විද්‍යාත්මක අධ්‍යයනයක්

එන්. ඊ. එච්. ලංකා[1]

චිත්‍රපට නිර්මාණයේ දී උපයුක්ත මුඛ්‍ය මාධ්‍ය වනුයේ දෘශ්‍ය රූපය යි. එහි භාවිත දෙබස් යනු අදහස් සූචනය උදෙසා පවතින වෛකල්පික ක්‍රමවේදයකි. චිත්‍රපට දෙබස් මඟින් රූපයෙන් ප්‍රකාශිත අදහස තීව්‍ර කොට දක්වයි. එහෙයින් චිත්‍රපටයක අන්තර්ගත දෙබස් වනාහි සිනමා රූප හා ශබ්දවල සංකලනයකි. තිර රචකයා රචිත දෙබස් අධ්‍යක්ෂවරයා ස්වීය කෙටුම්පත තුළ දී විවිධ සංස්කරණයන්ට ලක්කර සිනමා රූප සමඟ ගළපමින් නව්‍ය ආකාරයට පුනර් රචනය කරයි. චලන රූපය කොතෙක් ශක්තිමත් වුවද ඖචිත්‍යවත් භාෂණ ශබ්දයද චිත්‍රපටයෙහි තේමාව උදෙසා ප්‍රබල පිටුබලයක් ලබා දේ. බෞද්ධාගමික තේමා විෂය කොට ගනිමින් නිර්මාණයවන සිනමාපටයක දී, අධ්‍යක්ෂවරයා තේමාවට උචිත අයුරින් භාෂණ ශබ්ද අනුසාරයෙන් දෙබස් නිර්මාණය කරගන්නා ආකාරය විවරණය පර්යේෂණයේ මුඛ්‍ය ආරම්මණය වේ. තේමාවට අනුකූලව දෙබස් නිර්මාණය කරගැනීමේ දී අධ්‍යක්ෂවරයා භාවිත භාෂණ ශබ්ද කවරක්ද? යන්න පර්යේෂණ ගැටලුව වේ. සිනමාව හා වාග්විද්‍යාව යන විෂය ධාරා අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස හැඳින්විය හැක. පර්යේෂණයේදී, බෞද්ධාගමික තේමා වස්තු විෂය වූ සිංහල සිනමාපට අතරින් ශ්‍රී සිද්ධාර්ථ ගෞතම, මහින්දගමනය, සංකාරා හා උප්පලවණ්ණා යන සිංහල සිනමාපට හතරට සීමා වේ. සිනමාපට නැරඹීම, සම්මුඛ සාකච්ඡා හා පුස්තකාලය සමීක්ෂණය දත්ත ඒකරාශී කිරීමේ දී උපස්ථම්භක විය. පළමුව සිනමාපට තුළ සජීවීව ශ්‍රවණය වන භාෂණ ශබ්ද පිටපත් කරගැනීමෙන් මතු ඒවා චලන රූප සමඟ සංසන්දනය කෙරිණ. දෙවනුව ශබ්දිම, පදිම, වාක්‍ය, අර්ථ හා ප්‍රකරණ විචාරාත්මක අනුපද්ධතීන්ට අනුකූලව දත්ත විශ්ලේෂණය කරන ලදී. සංස්ථිතික වාග්විද්‍යාවේ හා ඓතිහාසික වාග්විද්‍යාවෙහි න්‍යාය ගුරු කොට ගනිමින් උක්ත පර්යේෂණ ගැටලුවට නිගමන ගවේෂණය කරමින් පර්යේෂණ පත්‍රිකාව සැකසිණ.

**ප්‍රමුඛ පදඃ** භාෂණ ශබ්ද, ශබ්දිම, සංස්ථිතික වාග්විද්‍යාව, ඓතිහාසික වාග්විද්‍යාව, පදිම

---

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
Email: hasini.lanka@gmail.com